# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No ..DSD/HO/DG/චක්‍රලේඛ.. | ඔබේ අංකය<br>உமது இல<br>Your No .......... | දිනය<br>திகதி<br>Date ..2020.04.17.. |

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය සමෘද්ධි මූලස්ථාන කළමනාකරු,

සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා බැංකු කළමනාකරු,

සමෘද්ධි සංවර්ධන නිලධාරි,

**<u>උද්ගතවී ඇති ව්‍යවසනකාරී තත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු. 5,000/- දීමනාවක් ගෙවීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම් විසින් නිකුත් කරන ලද අංක PTF/03/2020(ii) හා 2020.04.15 දිනැති චක්‍රලේඛය පදනම් කර ගනිමින් කාන්තා ,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ ලේකම් විසින් අංක MWCA& SS/SEC/01 හා 2020.04.17 දිනැතිව මා වෙත එවන ලද ලිපියට අනුව පහත සඳහන් උපදෙස් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ වෙත ලබා දෙනු ඇත.

02. කොරෝනා වෛරසය (Covid-19) නිසා සෘජු හා වක්‍ර ලෙස ජීවනෝපාය මාර්ග අහිමි වූ ඉහත චක්‍රලේඛයේ සඳහන් ප්‍රතිලාභීන් වෙත , එක් පවුලකට එකවර ගෙවනු ලබන සමාජ ප්‍රතිලාභ රුපියල් 5,000/- (පන්දහස)ක දීමනාව ගෙවිය යුතුව ඇත.

03. ශ්‍රී ලංකා මහ බැංකුව , ලංකා බැංකුව හා මහජන බැංකුවේ ප්‍රධානීන් සමඟ සිදු කළ සාකච්ඡාව අනුව , අදාල බැංකු ශාඛා 2020.04.19 වන ඉරු දින විවෘත කිරීමට එකඟ වූ බැවින් , අදාල බැංකු කළමණාකරුවන් සමඟ සාකච්ඡා කර සමෘද්ධි බැංකුවට අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කරන මෙන් දැනුම් දෙමි. මෙම මුදල් සමෘද්ධි බැංකුව වෙත ගෙන ඒමේ දී හා බැංකුවේ රඳවා ගැනීමේ දී ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපති සමඟ සාකච්ඡා කර අවශ්‍ය ආරක්ෂක කටයුතු සපයා ගැනීමට පියවර ගන්නා මෙන් වැඩිදුරටත් දැනුම් දෙමි.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

04. විවිධ ක්ෂේත්‍ර වලට අදාලව ලද ලේඛන හා අයදුම්පත් සඳහා ග්‍රාමීය කමිටුවේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියලත් ලේඛන සමෘද්ධි බැංකුව වෙත ලැබීමෙන් පසු 2020.04.20 , 21 හා 22 යන දින වලදී සියළු ප්‍රතිලාභීන්ට ගෙවීම් කටයුතු කල යුතු ය.

05. මෙම සමාජ ප්‍රතිලාභ රුපියල් 5,000/- (පන්දහස)ක දීමනාව ගෙවීමේ දී 2020.04.06 දින නිකුත් කල චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

මේ සම්බන්ධයෙන් ඔබ සැම දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

| | | |
|---|---|---|
| 1. | කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය | - කා.දැ.ස. |
| 2. | ජනාධිපති ලේකම් ,ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා | - කා.දැ.ස. |
| 3. | අග්‍රාමාත්‍ය ලේකම්, ගාමිණී එස්. සෙනරත් මහතා | - කා.දැ.ස. |
| 4. | ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 5. | ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - 2020.04.17 ලිපියට අනුව කා.දැ.ස |
| 6. | රාජ්‍ය ලේකම් ,සමාජ ආරක්ෂණ අංශය | - කා.දැ.ස. |
| 7. | විගණකාධිපති ,විගණකාධිපති දෙපාර්තමේන්තුව | - කා.දැ.ස |
| 8. | අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව | - කා.දැ.ස. |
| 9. | සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව | - කා.දැ.ස. |
| 10. | ප්‍රධාන විධායක නිලධාරී , මහජන බැංකුව | - කා.දැ.ස. |
| 11. | ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 12. | අධ්‍යක්ෂ, ක්ෂුද්‍ර මූල්‍ය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 13. | සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |